Sinhababu, S.R. Nadeeka Kumudini
Premasiri, J.S.
Ranasinghe, Gangani Kumari
PAPER

**යක්ෂ සංකල්පය සහ ලාංකීය රජවරු අතර පැවති සබඳතාව පිළිබඳව අධ්‍යයනයක්**

**(අනුරාධපුර යුගය ඇසුරින්)**

**එස්. ආර්. නදීකා කුමුදිනි සිංහබාහු, ජේ.එස්. ප්‍රේමසිරි, ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය**
**ආර්.එම්. ගංගානි කුමාරි රණසිංහ, සමාජයීය විද්‍යා පීඨ පරිගණක මධ්‍යස්ථානය, කැලණිය විශ්වවිද්‍යාලය**
S.R. Nadeeka Kumudini Sinhababu, J.S. Premasiri,
Department of History, University of Kelaniya
Gangani Kumari Ranasinghe, Computer Centre, Faculty of Social Sciences, University of Kelaniya

**ශ්‍රී ලංකාව විජයාවතරණයත් සමඟ ශිෂ්ටාචාරවත් වීමට පෙර පටන් ම මෙරට යක්ෂ ගෝත්‍රිකයින් ජීවත් වූ බවට මහාවංසය වැනි ප්‍රාථමික මූලාශ්‍රය අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වේ. එහි විකාශනයක් ලෙසින් පසුකාලීනව යක්ෂ සංකල්පය බිහිවෙමින් ලාංකීය රාජ්‍යත්වය හා නොබිඳෙන සබඳතාවක් පැවති බව අනුරාධපුර යුගය පුරා ම හමුවන තොරතුරුවලින් ගම්‍ය වේ. විජයාවතරණයේ සිට අනුරාධපුර යුගය අවසානය දක්වා කාලය පර්යේෂණයෙහි කාල සීමාව වශයෙන් යොදා ගැනිණි. මහාවංසය, දීපවංසය, වංසත්ථප්පකාසිනිය වැනි ප්‍රාථමික මූලාශ්‍රය ද, ද්විතීයික මූලාශ්‍රය ද පර්යේෂණය අධ්‍යයනයේ දී ක්‍රම වේදය වශයෙන් යොදා ගැනිණි. යක්ෂ සංකල්පය සහ ලාංකීය රජවරු අතර කෙබඳු සබඳතාවක් පැවතියේ ද යන්න මෙහි ගැටලුව වශයේන සඳහන් කළ හැකි ය. පර්යේෂණයෙහි ප්‍රධාන අරමුණ වනුයේ යක්ෂ සංකල්පය යනු කුමක්ද? සහ එම සංකල්පය රාජ්‍ය පාලනය සමඟ කෙබඳු සබඳතාවක් පැවතියේද යන්න අධ්‍යයනය කිරීමයි. එමෙන් ම මේ සඳහා රජවරු දක්වන ලද රුචිකත්වය කවරාකාර වූයේද? රාජ්‍ය අනුග්‍රහය කෙතෙක්දුරට ලැබුණේ ද? සහ එම අනුග්‍රහය සාර්ථක වූයේ ද? සහ පාලකයා යක්ෂ සංකල්පය කෙරෙහි යොමු වනවිට එය සාමාන්‍ය ජන සමාජයට කෙසේ බලපෑම් කළේ කෙසේ ද? යන්න උප අරමුණු වශයෙන් අධ්‍යයනය විය. එමෙන් ම අනුරාධපුර යුගයේ රජවරු යක්ෂ සංකල්පය කෙරෙහි රුචිකත්වයක් දැක්වූ බව උපකල්පනය කළ හැකි ය. අනුරාධපුර සමයේ රජවරු සිය රාජ්‍ය පාලන කටයුතුවල දී යක්ෂ සංකල්පය සඳහා අනුග්‍රහය ලබාදුන් බවත්, මේ නිසා ම මෙය ජන සමාජයේ ප්‍රචලිත වන්නට ඇති බවත් නිගමනය කළ හැකි ය.**

***ප්‍රමුඛ පද ථ යක්ෂ සංකල්පය, අනුරාධපුරය, විජයාවතරණය***